**B**

# නිවේදනය

ඉන්දීය අග්‍රාමාත්‍ය අතිගරු ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා විසින් 2015 මාර්තු මස 13 වැනි සිකුරාදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇමතීමට අදාළව පහත සඳහන් විශේෂ ආරක්ෂක විධිවිධාන ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙත මෙයින් දැනුම්දෙනු කැමැත්තෙමි:-

- 2015 මාර්තු මස 12 වැනි බ්‍රහස්පතින්දා සහ 13 වැනි සිකුරාදා ගරු මන්ත්‍රීවරුන්ගේ විවේක කාමර, ඇඳුම් අල්මාරි ද, ඇතුළුව සමස්ත පාර්ලිමේන්තු ගොඩනැගිල්ලම, ආරක්ෂක පරීක්ෂාවට ලක් කරනු ඇත.

- <u>2015 මාර්තු මස 13 වැනි සිකුරාදා</u>

  (අ). මෙදින මහජන ගැලරිය ආරාධිත අමුත්තන් සඳහා පමණක් සීමා කරනු ඇත.

  (ආ). ආරාධිත අමුත්තන් හැරුණු විට මෙදින පාර්ලිමේන්තුවට වෙනත් අමුත්තන් කැටුව නොපැමිණෙන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

  (ඇ). මෙදින පාර්ලිමේන්තු රථගාල වසා තබන බැවින් ගරු මන්ත්‍රීවරුන් පැමිණෙන වාහන අදාළ රථ ගාල් වෙත යොමු කරනු ලැබේ.

  (ඈ). තම කලත්‍රයා කැටුව පැමිණෙන ගරු මන්ත්‍රීවරුන්ට මෙදින කාර්ය මණ්ඩල පිවිසුමේ දී තම වාහනයෙන් බැස පාර්ලිමේන්තු ගොඩනැගිල්ලට පිවිසිය හැකිය.

  (ඉ). මෙදින, තමන් විසින්ම, තම රථය පදවාගෙන එන ගරු මන්ත්‍රීවරුන්ගේ වාහන නියමිත රථගාල වෙත ධාවනය කර ගාල් කිරීම පිණිස කාර්ය මණ්ඩල සහ මන්ත්‍රී පිවිසුම්වල පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් රියැදුරන් රාජකාරියේ යොදවනු ලැබේ.

  එබැවින්, මෙදින රියැදුරෙකු කැටුව තම වාහනයෙන් පාර්ලිමේන්තුවට පැමිණෙන ලෙස ගරු මන්ත්‍රීවරුන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

  (ඊ). මෙදින රථවාහන පොලීසිය සහ සමීප පොලිස් ස්ථාන මගින් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.